

# කස්තිරම

## ඩී බී කුරුප්පු

ජැක්සන් ඇන්තනිගේ නවතම නිර්මාණය වන "අබා'' චිත්‍රපටය ලැබූ වාණිජ සාර්ථකත්වයට පමණක් නොව ඉමහත් ප්‍රේක්ෂක ප්‍රසාදයට ද ප්‍රධාන සාධකය වූයේ කල් තියා ඒ පිළිබඳව නිර්මාණය කරන ලද ප්‍රතිරූපය යි. එබඳු ප්‍රතිරූපයක් සහිතව ජනතාව ඉදිරියට එන කවරකුට හෝ කවරකට වුවත් එල්ල වන චෝදනා දෝෂාරෝපණ පවා අසාර්ථක ව්‍යායාම බවට පත් වන්නට ද ඉඩ තිබේ.

ප්‍රතිරූපය නම් වූ මෙම ගුප්ත බලවේගය තදින්ම බලපාන්නේත්, අතිශය සූක්ෂ්මාකාරයෙන් උපයෝගී කර ගනු ලබන්නේත්, දේශපාලකයන් විසිනි - දේශපාලන වේදිකාවක ය. ඒ පිළිබඳව හොඳම නිදසුනත් අපගේ මව්බිමෙන්ම ගෙන හැර පෑ හැකිය. අවුරුද්දකට, හමාරකට කලින් පවා කුරිරු මිනිසකු හා දයා විරහිත දේශපාලකයකු වශයෙන් මුළු රටම දැනගෙන සිටි ජේ.ආර්.ජයවර්ධන මහතා 1977 මහ මැතිවරණය එළඹෙත්ම බෝධිසත්ව ගුණෝපේත මනා බෞද්ධ නායකයකු ලෙසින් ඡන්දදායකයා වෙත ඉදිරිපත් කිරීමට ප්‍රතිරූප නිර්මාපකයෝ සමත් වූහ. මෙම අපූරු නිර්මාණකරුවෝ ඇමරිකානුවෝ වූහ යි කතාවක්ද එවක ප්‍රචලිතව තිබුණු බව මට මතකය.

කෙසේ හෝ උතුමාණන් වහන්සේ එම අති උත්තම ප්‍රතිරූපයට මුවා වී ගෙන මුළු රටටම කාලාන්තරයක් තිස්සේ බලපාන විදියේ - හරියටම කියතොත් ගොඩ එන්නට බැරි විදියේ විපර්යාස හා නව නිර්මාණ ගණනාවක් කරන්නට සමත් වූහ. සමහර විට ඔහුගේ ක්‍රියා පටිපාටියේ ආදීනව වටහා ගන්නට ඔහු කරළියෙන් ඉවත් වුණාට පසුවත් ජනතාව අපොහොසත් වී යයි ද කිව හැකිය.

ඔහුට කරන ගෞරවයක් හැටියට ඔහු විසින් හඳුන්වා දෙන ලද අසමසම ධර්මිෂ්ට රාජ්‍ය සමය තුළ කරන ලද වික්‍රම අතුරින් කිහිපයක්වත් සඳහන් කළ යුතුය. දිවයිනේ පැවැති ජාතික, සංස්කෘතික රටාව හා පදනම දෙදරා යන විදියේ නව ආර්ථික හා සංස්කෘතික බලවේග ගලා ඒමට දොරටු සියල්ලක්ම විවර කර දුන් එතුමා, රටට දිරවා ගත නොහැකි සුවිශේෂ ව්‍යවස්ථාවක් ඉදිරිපත් කොට, අසමසම බලධාරී ජනාධිපතිවරයා බවට තමා-උහා තබා ගත්තේය. ප්‍රජාතන්ත්‍රයට යන්තමින් හෝ උරුමයක් කියන කවර දේශනයකදී වුව පිළිකෙව් කරනු ලබන ජනමත විචාරණය නොහොත් කළගෙඩි සෙල්ලමක් රඟපෑමෙන් ඔහු පරණ ව්‍යවස්ථාව යටතේ පත් වූ පාර්ලිමේන්තුව සපුරා වෙනස්, නව ව්‍යවස්ථාව යටතේද දිගටම පවත්වා ගෙන යාමට අවශ්‍ය ජීව වායුව පිම්බේය. ඒ තමාට අවනත මන්ත්‍රී පිරිසගේ ආයු නොපිරිහී පවත්වා ගන්නටය.

මහා ප්‍රජාතන්ත්‍රවාදියා වශයෙන් එතුමා උහා තබන්නට පටන් ගත් අපරදිග නායකයෝත්, පුවත්පත් කරුවෝත් මේ කිසිවක් නොදුටු, නොදකින වන්දිභට්ටයෝ වූහ. තමන්ට ලැබුණු සුවච කීකරු අතවැසියාට හානියක් කිරීමට ඔවුහු පසුබට වූහ. මහා ප්‍රජාතන්ත්‍රවාදියාට විරුද්ධකාරයින් නිහඬ කිරීම පමණක් රුචි නොවීය. ඔවුන් සිපිරි ගෙයි ලා ගෙන වද දීමට ද අවශ්‍ය විය. ඔහු නැක්සලයිට් නමින් මන්තරයක් මතුරා ගෙන විජය කුමාරතුංග වැලිකඩ උළු ගෙදර නොහොත් වධකාරයේ තැන්පත් කළේය.

ස්ටාලින් විසින් තම නාමය අමරණීය කරනු වස් බෞතීස්ම කළ ස්ටාලින්ග්‍රාඩ් පුරවරය ඔහුගේ අභාවයත් සමඟ රුසියාවෙන් අතු ගා දමන ලදී. අපගේ මහා ප්‍රජාතන්ත්‍රවාදියා විසින් සිය අමරණීය නාමය ඉර හඳ පවත්නා කල් නොමැකී පවත්වා ගනු වස් පරණ නමක් එළියට ඇද ගෙන එයට නවීන පලිප්පුවක් දමා ශ්‍රී ජයවර්ධන පුර නමින් අගනුවරක් ද අටවා ගත්තේය. එය නම් ඔහුගේ නමට ආශීර්වාදයක් නැතහොත් අපවාදයක් ලෙසින් තවත් කලක් නිරුපද්‍රිතව වැජඹෙනු ඇත.

දේශපාලන ප්‍රතිරූපය විටක ඇස් පනා පිටම වියැකී අඳුරු වී අඳුනා ගන්නට බැරි තරමට දුර්වර්ණ වී යාමටද ඉඩ ඇත. ලෝකයේ බලවත්ම, ධනවත්ම රට වශයෙන් පිළිගනු ලබන අමෙරිකා එක්සත් ජනපදයටත්- ලෝකයේම බලවතා වශයෙන් අවිවාදයෙන් පිළිගැනෙන එහි ජනාධිපතිවරයාටත් ගත වූ වසර හත අට තුළ සිදු වූයේ අන්න ඒ ඉරණමට මුහුණ දීමටය. ලෝකයේ පමණක් නොව රට තුළත් කවර කිසිමදාක සිටි ජනාධිපතිවරයෙකුටත් වඩා ජනතා අප්‍රසාදයට පත් වූවකුගේ තත්වයට එම ප්‍රතිරූපය බිඳ හෙළන්නට ජෝර්ජ් බුෂ් සමත් විය. එහෙම වැටුණත් තමා සිතින් මවා ගත් ප්‍රතිරූපය අත් හරින්නට ඔවුන් කැමති නැත. පසුගිය දා තම විමානයෙන් චුත වන්නට සැරසෙමින් ඒ නායකයා කට මැත දෙඩුවේ තමා කළ වික්‍රම ගැනය. මුළු ලොවටම සැඳූ සෙත ගැනය. දේශපාලකයා වූ කලී රටට නොහොත් ලෝකයට තාවකාලික සම්පතකි - නොහොත් විපතකි. සදාකාලික පැවැත්මක් ලැබෙන්නේ ඒකාධිපතීන් කිහිප දෙනෙකුට පමණි. එයත් සදහටම නොවේ.

**_ලේඛකයා දේශපාලකයාගෙන් වෙනස් වන්නේ ඔහු හෝ ඇය දීර්ඝකාලීන පැවැත්මක් උරුම කොට ගෙන ලොව පහළ වන නිසාය. ඒ පැවැත්ම ශාරීරික වශයෙන් පමණක් අල්ලා සිටින්නක් නොවේ. ඔහුගේ හෝ ඇයගේ නිර්මාණ ඔස්සේ පාඨකයා අත්විඳින වින්දනය ඔස්සේ ක්‍රියාත්මක වන්නකි. ලේඛකයා දේශපාලකයා මෙන් තාවකාලික දීප්තියකින්, බැබළීමකින් තෘප්තියට පත්වන්නෙක් නොවේ. පත් විය යුතු ද නොවේ._**

ලේඛකයා දේශපාලකයාගෙන් වෙනස් වන්නේ ඔහු හෝ ඇය දීර්ඝකාලීන පැවැත්මක් උරුම කොට ගෙන ලොව පහළ වන නිසාය. ඒ පැවැත්ම ශාරීරික වශයෙන් පමණක් අල්ලා සිටින්නක් නොවේ. ඔහුගේ හෝ ඇයගේ නිර්මාණ ඔස්සේ පාඨකයා අත්විඳින වින්දනය ඔස්සේ ක්‍රියාත්මක වන්නකි.

ලේඛකයා දේශපාලකයා මෙන් තාවකාලික දීප්තියකින්, බැබළීමකින් තෘප්තියට පත්වන්නෙක් නොවේ. පත් විය යුතු ද නොවේ.



# ප්‍රතිරූපය සහ ප්‍රතිචාරය

## ඩී. බී. කුරුප්පු

ප්‍රතිරූපය අමතක කළ නොහැකි තවත් ගණයක ලේඛක පිරිසක්ද සිටිති. ඒ පුවත්පත් කතුවරුය. ඔවුන් කරන්නේ තමා පුද්ගලිකව ඉදිරිපත් වී පෙනී සිටීම නොව, තමා යටතේ තමාගේ මෙහෙය වීමෙන් නිර්මාණය වන පුවත්පත විසින් නිර්මාණය කරනු ලබන ප්‍රතිරූපය නොකෙළෙසී පවත්වා ගැනීමට ක්‍රියා කිරීමය. බොහෝ ප්‍රශස්ත පුවත්පත් වල කතුවරුන් ගැන පාඨකයන් කිසි තොරතුරක් නොදන්නා තත්වයක් දක්නට ඇත්තේ ද කතුවරයා සිය නිර්මාණය පිටුපසට වී කරන පෙළහර නිසාමය. ඔහු පුද්ගලික ප්‍රතිරූපයක් හඹා නොයන නිසාය.

පුවත්පත් කතුවරු ගැන අවධාරණය කළ යුතු තවත් වැදගත් අංශයක් ඇත. එක් අතකින් කතුවරයා හෝ කතුවරිය ඇමතිවරයකු බඳු වගකීමක් දරන බලවතක් ද වෙයි. තමා යටතේ සේවය කරන කවර නිලධාරියකු වුව ද කරනු ලබන වරද ගැන අවසන් වගකීම දරන්නට වන්නේ ඇමතිවරයාටය. තමා යටතේ ක්‍රියාත්මක වන පුවත්පතේ පළවන හැම වචනයක් පිළිබඳවම වගකීම කතුවරයා විසින් දැරිය යුතු යැයි මා කිවහොත් පුදුමයට පත් වන්නන් ද සිටිය හැකිය. මා මේ බව කියන්නේ ශ්‍රී ලංකාවේ දී මා දැන සිටි කතුවරුන් දෙස හැරී බලමිනි. තමන් යටතේ වැඩ කළ නවකයන් විශිෂ්ට පුවත්පත් කලාවේදීන් බවට පරිවර්තනය කිරීමේ සුපිරි සමත්කමක් පළ කළ පුවත්පත් කලාවේදී ඩී.බී.ධනපාල මේ අතරින් කැපී පෙනෙන්නෙකි. ඔහු

16 වන පිටුවට

Mobile Pet Vet
Let the Vet come to you
AFFORDABLE
QUALITY VETERINARY CARE
AT YOUR HOME
Services Include:
Consultation and treatment
Vaccination C5 C3 F3 Heart worm and rabbit vac
Deworming and Declawing
Microchipping
Euthanasia
Surgery is arranged at the clinic

10% discounts for pensioners and multiple pet owners
For appointments telephone
Dr. Sudharma Gamage BVSc
0433 49 21 21
Servicing South Eastern Suburbs

Mathematics at Caroline Springs
- Give a head start to your sons/daughters in 2009!!!.
- Affordable group tuition by Victorian Institute of Teaching Registered Experienced High School Maths Teacher.
- Limited number of students only
Western Suburb class at Caroline Springs
> Grade 7, 8,9,10 classes start on February
> Special classes for learning diffi culty students.
> Prepare for all school entry exams.
> VCE classes starting soon……
Teacher:
Mano Perera
Grd. Dip Edu., B.Sc., Dip. Acc.
Member of Mathematic Institute of Victoria
Ph. : 8361 7716 or 04300 79560
Email. : pereramano@gmail.com or
Perera.mano.m@edumail.vic.gov.au